# ශ්‍රී/ස ලංකා නැව් සංස්ථාව

## (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය)

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පවතින ඇබෑර්තුව පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1) ගොඩබිම් නම්කළ තැනැත්තා තනතුර– කොන්ත්‍රාත් පදනම (ඇබෑර්තු 01)

**සුදුසුකම් :**

කපිතාන්වරයෙක් (Master) ලෙස 1 වෙනි පන්තියේ නිපුණතා සහතිකය (COC)

කපිතාන්වරයෙක් (Master Mariner) වශයෙන් අවම වශයෙන් වසර 03 පළපුරුද්ද (විශේෂයෙන් තොග බහාලුම් නෞකා වල )

**පළපුරුද්ද :** පිළිගත් නැව් හිමි මෙහෙයුම් සමාගමක ගොඩබිම් නම්කළ තැනැත්තෙකු (DPA තනතුර) ලෙස අවම වශයෙන් වසර 01ක පළපුරුද්ද

**වැටුප :** මාසික දීමනාව රු. 450,000/- ට අමතරව රජයේ චක්‍රලේඛනයන්ට අනුව ප්‍රවාහන පහසුකම් සහ ඉන්ධන දීමනා

**රැකියා විස්තරය :**

වගකීම්

- ආයතනයේ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (SMS) සන්නිවේදනය කිරීම සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික අංශය සමග සාකච්ඡා කොට කපිතාන්වරු සහ ආයතනයේ කළමනාකාරීත්වයට උපදෙස් දීම හා සම්බන්ධීකරණය කිරීම.
- තාක්ෂණික අංශ ප්‍රධානියා සමග සාකච්ඡා කර (in consultation) නැව් සංස්ථාවේ සියලුම නැව් වල වෙරළාශ්‍රිත හා නැව හා සම්බන්ධ (both shore board & on board) ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය(SMS)/ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම.
- විවිධ නැව් වාර්තා නිරතුරුව පරීක්ෂා කරමින් නැව් වල මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කිරීම.

- නැවේ ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය(SMS) සහ වැඩි දියුණු කිරීම සහ නැවේ වාර්තා කිරීම්( Ship Board Recording) පසු විපරම් කිරීම.

- සියලුම ව්‍යවස්ථා හා වර්ගීකරණ සමාජ සමීක්ෂණ (Classification Society Surveys) සම්බන්ධයෙන් නියෝග දීම සහ නියමිත වෙලාවට ක්‍රියාත්මක කිරීම.

- ප්‍රමාණවත් සම්පත් සහ ආයතනය මගින් ලැබිය යුතු වෙරළ ආශ්‍රිත (shore based support) අවශ්‍ය සහයෝගය සැපයීම තහවුරු කිරීම සහ අලුත් වැඩියා හා අමතර කොටස් ප්‍රසම්පාදනය තහවුරු කිරිම.

- ගොඩබිම් නම්කළ නිලධාරි (DPA තනතුර) කටයුතු ඇගයීම නිරීක්ෂණය කිරීම විශේෂයෙන් දුරස්ථව හා අඛණ්ඩව නිරීක්ෂණය කිරීම නැවේ ආරක්ෂිත කළමනාකරණ පද්ධතියේ (SMS) සඵලතාවය සමාලෝචනය කිරීම.

- නැව් කාර්ය මණ්ඩලය කලමණාකාරීත්වයේ අඩුපාඩු නොගැලපීම්, අනතුරු හා අනතුරු දායක සිදුවීම් වාර්තා කිරීම, විමර්ශනය කිරීම සහ විශ්ලේෂණය කිරීම.

- කළමනාකරණ සමාලෝචන කමිටු රැස්වීම් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම හා එහි වාර්තා තැබීම හා නඩත්තු කිරීම.

- International Maritime Organization අවශ්‍යතාවයන්ට අනුකූලව සහ නූතන මාර්ගෝපදේශ අනුගමනය කරමින් අදාළ බලධාරීන්ට අවශ්‍ය වූ විට අතිරේක අත් පොත් (additional manuals) සම්පාදනය කිරීම.

- හදිසි අවස්ථාවන් ආවරණය වන පරිදි ship/ show contingency plans සමාලෝචනය කිරීම හා සම්පාදනය කිරීම.

- ජාත්‍යන්තර රෙගුලාසි වලට අනුකූලව නාවික හා නැව් මත (Marine shipboard) ආරක්ෂාව සහ පාරිසරික ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීම.

- තාක්ෂණික දෙපාර්තුමේන්තු ප්‍රධානියා සහ වාටරින් සහ ඒජන්සි දෙපාර්තුමේන්තු ප්‍රධානීන් සමග සම්බන්ධීකරණය වෙමින් නැව් කපිතාන්වරුන් (Masters) වෙත මුහුදු ගමන් පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.

- විදේශීය වරාය නියෝජිතයින් (Foreign Port Agency) වෙත උපදෙස් ලබාදීම.

**වයස් සීමාව: -** වයස අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 60 ට නොවැඩි විය යුතුය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ/සේ.නි.භා.අ.
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගතකිරීම් රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගලික අනතුරු රක්ෂණ ආවරණය
4. සන්නිවේදන වියදම් ආපසු ගෙවීම්

## පොදු උපදෙස්

- සියලුම අයදුම්පත් සමඟ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් තමා විසින්ම සහතිකකොට උප්පැන්න සහතිකය හා අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපැලෙන් මෙම දැන්වීමේ දින සිට දින 07 ක් ඇතුලත සභාපති, සී/ස ලංකා නැව් සංස්ථාව, නො.27 ,MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් මාවත), කොළඹ 01** ලිපිනයට හෝ **chairman@cscl.lk /hr@cscl.lk** යන විද්‍යුත් තැපැලට ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.

- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.

- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

---

**සභාපති**

**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**

**අංක 27, MICH ගොඩනැගිල්ල**

**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**

**කොළඹ 01**

වැඩි විස්තර සඳහා (+94) 011 239 4624 / දිගුව 258 - මානව සම්පත් අංශය

දිනය : 08.09.2024